# කපුගොඩ ගිරිදර පුරාණ විහාරය හා තදාශ්‍රිතව හමුවූ බෝධිසත්ව පිළිමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඉහලගම බුද්ධප්‍රිය හිමි[1], කලාකරඹෑවේ සුජාත හිමි[2]

ප්‍රමුඛ පදඃ ගිරිදර, ධ්‍යාන මුද්‍රාව, නාග කේශර මල, පද්මාසන, ව්‍යාඛ්‍යාන මුද්‍රාව

## හැඳින්වීම

කපුගොඩ ගිරිදර පුරාණ විහාරය බස්නාහිර පළාතේ පිහිටා ඇති පුරාණ පුදබිමකි. මෙම විහාරය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් වේ. මහනුවර යුගයේ නිර්මාණය කරන ලද ප්‍රතිමාවක් සහ සිතුවම් සහිත විහාර ගෘහයක් මෙහි දෘෂ්‍යමානය. විහාරයට තදාසන්න අම්පිටියාගල නම් ස්ථානයෙන් ක්‍රි.ව 1960 වර්ශයේදි සීසාමින් සිටි ගොවියෙකුට කුඹුරක තිබී බෝධිසත්ත්ව ප්‍රතිමාවක් හමුවී ඇති අතර වර්තමානයේ සංරක්ෂණය කොට කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇත. විෂම ලෝහ මිශ්‍ර වූ මෙම ප්‍රතිමාව තද පැහැයෙන් යුක්තය. මෙහි පර්යේෂණ ගැටළුව වනුයේ විහාරයේ ඓතිහාසිකත්වය කෙතෙක් ද? බෝධිසත්ත්ව ප්‍රතිමාවේ විෂමතා කවරේද? යන්න අධ්‍යයනය කිරීමයි. පර්යේෂණ අරමුණ බවට පත්වනුයේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම හා බෝධිසත්ත්ව ප්‍රතිමාවේ ලක්ෂණ හඳුනා ගැනීම වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදි ක්ෂේත්‍රගත නොවන හා ක්ෂේත්‍රගත අධ්‍යයනයන් සිදුකරන ලදි. ක්ෂේත්‍රගත නොවන අධ්‍යයන යටතේ සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, ජනශ්‍රැතික අධ්‍යයන හා සම්මුඛ සාකච්ඡා ත් ක්ෂේත්‍රගත අධ්‍යයන යටතේ පුරාවිද්‍යාත්මක සාධක නිරීක්ෂණ මූලික විය. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයත් දත්ත ඉදිරිපත් කිරීමේදි ඡායාරූප හා සටහන් භාවිත කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරිදර ග්‍රාමයෙහි පිහිටා ඇති මෙම විහාරය ඓතිහාසික සියනෑ කෝරළයේ ගඟබඩ පත්තුවට අයත් පුදබිමකි. හංවැල්ල කිරිදිවැල ප්‍රධාන මාර්ගයේ හංවැල්ල නගරයේ සිට කි.මී 06 ක් පමණ ගිරිදර දෙසට ගමන් කළ විට තත් විහාරයට ප්‍රවිෂ්ඨ වීමට පිළිවන. විහාරස්ථානය පිළිබඳ තොරතුරු විමසීමේදී පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික තොරතුරු රාශියක් දැන ගැනීමට හැකි විය.

[1,2] බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය
ihalagamabuddhapriya@gmail.com rksujatha2000@gmail.com

තත් විහාරස්ථානයෙහි ආරම්භය 17 වන සියවස දක්වා දිව යන අතර විහාරස්ථාන භූමියෙහි කුඩා ගල්තලාවක් මත ඉදිකර ඇති ඉපැරණි විහාර ගෘහයේ ශේෂ වූ ඉපැරණි චිත්‍ර දැකගත හැකිය. විහාරගෘහයෙහි දක්නට ලැබුණු පද්මාසනයෙන් වැඩ සිටින ධ්‍යාන මුද්‍රා නිරූපිත ප්‍රතිමාව ද, බිතුසිතුවම් ද මහනුවර සම්ප්‍රදායට සමීපතාවයක් පෙන්නුම් කරයි. බුද්ධ ප්‍රතිමාවෙහි තරංගාකාර රැලි හා සිරස්පත මනාව නෙලා ඇති අතර මෙහි බිතු සිතුවම් වල මානව රූප දැක්වීමේ දී මහනුවර යුගයේ පහතරට සිතුවම් සම්ප්‍රදායට නැඹුරුතාවයක් පෙන්නුම් කෙරේ. වර්ෂ 1922 දී එහි ආවාස ගෘහය ප්‍රථම වරට ප්‍රතිසංස්කරණය කර ඇති අතර විහාර ගෘහය මෑත කාලීනව ප්‍රතිසංස්කරණය කර ඇත.

මෙම විහාරස්ථානයට තදාසන්නව හමුවූ වැදගත් පුරා කෘතියක් වශයෙන් ගිරිදර බෝධිසත්ව ප්‍රතිමාව පෙන්වාදිය හැකිය. මෙම ප්‍රතිමාව මුල්වරට සොයාගනු ලැබුවේ ක්‍රි.ව 1960 වර්ෂයේ දී සීසාමින් සිටි ගොවියෙකු විසිනි. පසුව මෙම පිළිමය විහාරස්ථානයට පූජා කර අතර බුද්ධ ප්‍රතිමාවක් නොවූයෙන් පසුව මෙය මාලිද නම් ස්ථානයේ බෝධිය අසල තබා ඇත. පසුව මෙහි පෞරාණිකත්වය වටහාගත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි කටයුතු කළ වානලුවාවෙහි පදිංචි ඝග් කොරනේරිස් නම් පුද්ගලයෙකු මෙම පිළිමය කොළඹ මහජන කෞතුකාගාරයට භාර කොට ඇත. මෙම පිළිමය ලෝකඩින් නිමවා ඇති නමුදු තද කහ පැහැයෙන් යුක්ත වන අතර ඊට හේතුව ලෙස කලා විචාරකයන් පෙන්වා දෙනුයේ ලෝකඩ මූර්ති නිර්මාණය කිරීම සඳහා තඹ සහ ටින් යන ලෝහ දෙවර්ගය එකිනෙකට මිශ්‍ර කිරීමේ අනුපාතය විෂම වූ බැවින් මේ තත්ත්වය ඇති වී ඇති බවයි. හිටි ඉරියව්ව නිරූපිත මෙම මූර්තියේ වම් පාදය කැඩී ගොස් ඇත. දෙපා එකිනෙකට සමීප වන අයුරින් පිහිටා ඇති අතර එලෙස පාද පිහිටුවීමෙන් ඇතිවන ඉරියව් සමභංග ඉරියව් ලෙස විස්තර කෙරේ. මනා ලෙස සැරසූ ශීර්ෂය බෙහෙවින් සමීප වනුයේ සේරුවිලින් හා අම්බලන්තොටින් සොයාගෙන දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ශෛලමය නිර්මාණ ප්‍රදර්ශන ශාලාවේ තැන්පත් කර ඇති බෝධිසත්ව ශීර්ෂවල හිස් පළඳනාවන්ටය. හොඳින් විවර වූ දෙනෙත් හා ඝන දෙතොල් ප්‍රතිමාවට සජීවී බවක් එක් කරයි. ප්‍රතිමාවේ වමත ව්‍යාඛ්‍යාන මුද්‍රාව දරන අතර දකුණත අත්ල ඉදිරියට විවෘත වන සේ දක්වා ඇත. මෙම බෝධිසත්ව මූර්තියේ ලක්‍ෂණ අනුව එමඟින් කුඩා බෝධිසත්ව වරයෙකු නිරූපිත වන්නේද යන්න වියතුන් අතර මත පවතී. මෙම මූර්තියේ ශීර්ෂ පලදනාවේ ඇති පෙති හතරකින් යුත් සලකුණු මහාචාර්ය සෙනරත් පරණවිතාණ මහතා විසින් පැහැදිලි කරනුයේ එමගින් සමන්ත භද්‍ර බෝධිසත්වයන් නිරූපණය කරන බවයි. මහාචාර්ය නන්දසේන මුදියන්සේ මහතා විසින් එම සංකේතය මෛත්‍රීය බෝසතුන්ට සම්බන්ධ ලක්ෂණයක් වූ නාග කේශර මල ලෙස පැහැදිලි කරයි. කෙසේවෙතත් තාන්ත්‍රික ග්‍රන්ථවල සඳහන් වන නාග කේශර මල මෛත්‍රීය බෝසතුන් අත දරන්නක් මිස එය හිස් වැසුමෙහි අංගයක් ලෙස පිළිගත නොහැකි බව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ සිරි නිමල් ලක්දුසිංහ මහතා විසින් පෙන්වා දෙයි. ලක්දිව බෝධිසත්ව මූර්ති අතර අති විශිෂ්ට

නිර්මාණයක් සේ සැලකිය හැකි මෙම අගනා මූර්තිය එහි කලාත්මක ලක්ෂණ අනුව ක්‍රි.ව. 6 - 7 සියවස් වලට අයත් බව පුරාවිද්‍යාඥයෝ විසින් පෙන්වා දෙති.

**නිගමනය**

මහනුවර යුගයේ නිර්මාණගත ශෛලියට අනුව නිමවා ඇති ප්‍රතිමා ගෘහය විහාරයේ ආරම්භක අවධිය මහනුවර යුගයේ යැයි පැවසිය හැකි පොදු සාධකයකි. විහාර ගෘහයට අමතරව වෙනත් කිසිඳු ආගමික ගොඩනැගිල්ලක සාධක වර්තමානයේ විහාර භූමියෙන් හමු නොවේ.

බෝධිසත්ත්ව ප්‍රතිමාව වෙනත් පැහැයක් ගනු ලබන්නේ ලෝහ භාවිතයේ ඇති වූ විෂමතාවක් නිසාවෙන් බව විද්වත් මත මඟින් පැහැදිලි වේ. සමභංග ඉරියව් නිරූපිත බෝධිසත්ත්ව ප්‍රතිමාව මඟින් සමන්තභද්‍ර බෝධිසත්ත්වයන් නිරූපිත බව අදහසකි. මහායානයේ පැවත එන බෝධිසත්ත්ව වන්දනයට අදාල ප්‍රතිමාව කුමන අරමුණකින් මෙම ප්‍රදේශයෙන් හමුවීද යන්න තවදුරටත් පර්යේෂණ සිදුකල යුතු අංශයකි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

විජේසේකර, නන්දදේව. (1970). ***පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය.*** කොළඹ

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1996). ***ශ්‍රී ලංකාවේ බෝධිසත්ත්ව සංකල්පය.*** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

සාසනරතන හිමි, මොරටුවේ. (1999). ***ලක්දිව මහායාන අදහස්.*** බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශන

**සම්මුඛ සාකච්ඡා**

විමලානන්ද නා හිමි, මැදිරිගිරියේ. (2025) නා හිමි, කපුගොඩ ගිරිදර පුරාණ විහාරය පිළිබඳව. ඉහලගම බුද්ධප්‍රිය හිමි. 2025-04-03

පූජ්‍ය ඕවිටිගම සුමනානන්ද හිමි, ඕවිටිගම. (2025) නා හිමි, කපුගොඩ ගිරිදර පුරාණ විහාරය හා තදාශ්‍රිතව හමුවූ බෝධිසත්ත්ව පිළිමය පිළිබඳව. ඉහලගම බුද්ධප්‍රිය හිමි. 2025-04-03